# ශ්‍රී ලංකාවේ සමානුපාතික නියෝජන ක්‍රමය යටතේ ජාතික ලැයිස්තු ක්‍රමයේ භාවිතාව පිළිබඳ අධ්‍යයනයක්

**ජී. එන්. දිල්හානි හංසිකා**[1]

**සංක්ෂේපය**

ප්‍රජාතන්ත්‍රවාදී සංකල්පය තුළ දක්නට ලැබෙන ප්‍රධාන සංකල්පයක් වන නියෝජනය යනුවෙන් අදහස් කරනුයේ ජනතාවගේ අරමුණු මුදුන්පත් කර ගැනීම උදෙසා නියෝජිතයින් පත් කර ගැනීමට උපයෝගි කරගන්නා ක්‍රමයයි. ලෝකයේ බහුල වශයෙන් භාවිතයට ගනු ලබන ප්‍රධාන නියෝජන ක්‍රම දෙක වන්නේ බහුතර නියෝජන ක්‍රමය සහ සමානුපාතික නියෝජන ක්‍රමය වන අතර සමානුපාතික නියෝජන ක්‍රමය වඩාත් බහුලව ම භාවිතා කරන බව පූර්ව අධ්‍යයන වලින් අනාවරණය වී ඇත. ලංකාවේ සමානුපාතික නියෝජනය තුළ ජාතික ලැයිස්තු ක්‍රමය ප්‍රධාන අංගයකි. මැතිවරණයට ඉදිරිපත් නොවන එහෙත් ජනතාවට සේවයක් කළ හැකි උගත් බුද්ධිමත් පිරිසකගේ සේවය ලබා ගැනීම උදෙසා මෙම ක්‍රමය ඇති කර තිබේ. ජාතික ලැයිස්තු ක්‍රමය මගින් අපේක්ෂිත අභිමතාර්ථ, එහි ක්‍රියාත්මකභාවයේදී ගැටලුවකට හසුව තිබේ ද යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙම අධ්‍යයනයට පාදක වූ මූලික ගැටලුව වන්නේ, ලංකාවේ නියෝජන ක්‍රමයෙහි අංග ලක්ෂණයක් වූ ජාතික ලැයිස්තු ක්‍රමය ක්‍රියාත්මකභාවයේ දී ගැටලු උද්ගත වන්නේ ද එසේ නම් ඒ මොනවාද යන්න හඳුනා ගැනීමයි. මෙහි සීමා ලෙස සමානුපාතික නියෝජන ක්‍රමයේ ලක්ෂණ අතුරින් ජාතික ලැයිස්තු ක්‍රමයට ප්‍රමුඛතාවය දක්වනු ලදි. අධ්‍යයන ක්‍රමවේදය ලෙස ප්‍රශ්නාවලි ක්‍රමය මගින් ප්‍රාථමික දත්ත රැස් කර ගන්නා ලදී.එම දත්ත සංඛ්‍යාන විශ්ලේෂණයට භාජනය කිරීමෙන් අනතුරුව ජාතික ලැයිස්තු මගින් යම් ආකාරයකට ජනතා නියෝජනයක් සිදු වුව ද ඉන් අපේක්ෂිත අරමුණු ප්‍රායෝගිකව ඒ ආකාරයෙන් ම ඉටු වී නොමැති බව නිගමනය කළ හැකිය.

**මුඛ්‍ය පද :** මැතිවරණය, සමානුපාතික නියෝජනය, ජාතික ලැයිස්තු ක්‍රමය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, dilhanihansika9@gmail.com